පාර්ලිමේන්තුව

பாராளுமன்றம்

**PARLIAMENT**

2023-09-20

පාර්ලිමේන්තුවේ මහලේකම්
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**2023-09-21 වන දින සභාව කල් තබන අවස්ථාවේ විවාදය සඳහා ඉදිරිපත් කිරීමට නියමිත යෝජනාව**

මෙරට ආගමික සිද්ධස්ථාන කිහිපයක් හා සංචාරක හෝටල් ඉලක්ක කර පාස්කු ඉරුදින සිදුකල බෝම්බ ප්‍රහාර ලක් ඉතිහාසයේ සිදුවූ ඉතා ම්ලේච්ඡතම දේශපාලන කුමන්ත්‍රණයක් බවට දැන් දැන් චෝදනා එල්ල වෙමින් පවතී.

මෙම ප්‍රහාරයේ සෘජු ගොදුරු බවට පත්වූයේ පාස්කු ආගමික වතාවත්වල නියැලුනු කිතුනු බැතිමතුන් සහ මෙවැනි ප්‍රහාරයක් එල්ලවෙතැයි කිසිසේත්ම අපේක්ෂා නොකල දෙස් විදෙස් සංචාරකයින් පිරිසකි. එහිදී සෘජුව ජීවිත අහිමි වූ හා විවිධ තුවාල සිදුවූ පුද්ගලයින්ට අමතරව රටේ ගොඩනැගෙමින් තිබුණු සංචාරක කර්මාන්තයට හා රටේ ආර්ථිකයට මරු පහරක් එල්ල විය.

මේ සම්බන්ධයෙන් එවක පැවැති රජය විසින් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක්, ජනාධිපති විශේෂ පරීක්ෂණ කොමිෂන් සභාවක් සහ මලල්ගොඩ කමිටුව පත් කෙරිණි. එම කමිටුවලින් ඉදිරිපත් කරන ලද වාර්තා කිහිපයක් ප්‍රසිද්ධියට පත් කරනු ලැබුවද, සම්පූර්ණ වාර්තා මේ දක්වා මහජන නියෝජිතයින්ට ලබා දී නොමැත.

මෙවන් පසුබිමක ජාත්‍යන්තර මාධ්‍ය ආයතනයක් විසින් නිකුත් කරන ලද වාර්තාමය වැඩසටහනක් තුළින් මෙම ම්ලේච්ඡ ත්‍රස්ත ප්‍රහාරය සෘජුවම හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා බලයට ගෙන ඒම සඳහා වාතාවරණය සකස් කිරීමේ අරමුණින් සිදුකල ප්‍රහාරයක් බවට චෝදනා කරයි. එමෙන්ම රාජ්‍ය බුද්ධි අංශය ඇතුළු ආරක්ෂක අංශවල පුද්ගලයින් කිහිප දෙනෙකු ද මෙම ප්‍රහාර මාලාවට සම්බන්ධ බවට එමගින් වාර්තා කර ඇත.

වසර 04 කට අධික කාලයක් ගතවී ඇතත් මෙතෙක් මෙම ප්‍රහාර සඳහා සෘජුව වගකිව යුතු පාර්ශ්වයන් හඳුනා ගැනීමටත්, ප්‍රහාරවල අරමුණු හෙළිදරවු කිරීමටත්, රජය අසමත්වී ඇත. රජය ඒ පිළිබඳව දක්වන උදාසීනත්වය සහ තොරතුරු සැඟවීමට උත්සාහ දැරීම නිසා පාස්කු ඉරුදින ප්‍රහාර වින්දිතයන්ට සාධාරණය ඉටු කිරීම රජය මගහරිමින් සිටී.

විවිධ පාර්ශ්වයන්ගෙන් එල්ලවන චෝදනා සඳහා පිළිතුරු සැපයීමට සත්‍ය තොරතුරු පදනම් කරගත් සහ විධිමත් විමර්ශනයක් අත්‍යවශ්‍ය වන අතර, දේශීය යාන්ත්‍රණයක් මගින් මේ සඳහා ප්‍රමාණවත් උත්සාහයක් නොගැනීම නිසා විදේශීය විමර්ශනයක් පැවැත්වීම අවශ්‍ය බව තවදුරටත් අවධාරණය කෙරෙයි. දේශපාලන අතකොළු බවට පත් නොවූ බුද්ධි අංශ සාමාජිකයින් සහ ආරක්ෂක අංශවල නිලධාරීන්ගේ ගෞරවය හා විශ්වාසනීයත්වය ආරක්ෂා කිරීමටත්, අපක්ෂපාති පරීක්ෂණයක් සිදුකර මෙයට සම්බන්ධ පුද්ගලයින් හෙළිදරව් කිරීම අවශ්‍ය වේ.

මෙම ප්‍රහාර මාලාව සම්බන්ධයෙන් චෝදනා එල්ල වූ ආරක්ෂක අංශවල සමහර පුද්ගලයන් දැනටත් තනතුරු දරමින් සිටීම පරීක්ෂණවලට බාධාවක් බැවින් එම නිලධාරීන් තාවකාලිකව වගකිය යුතු තනතුරුවලින් ඉවත් කර අපක්ෂපාති පරීක්ෂණයක් කිරීමත්, වගකිව යුත්තන්ට ඉතා ඉක්මණින් දඬුවම් ලබා දීමත් සිදු කළ යුතු බව මෙම සභාව යෝජනා කර සිටී.

**නිරෝෂන් පෙරේරා**
පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී